SUGGESTED SOLUTIONS

KE 5 – Commercial Insight for Management

සැප්තැම්බර් 2019

NOT FOR SALE

All Rights Reserved

1 වන කොටස

පිළිතුරු අංක **01**

1.1

ඉගෙනුම් ඵලය: 1.4.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **23**
නිවැරදි පිළිතුර : **D**

1.2

ඉගෙනුම් ඵලය: 2.4.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **72**
නිවැරදි පිළිතුර: **A**

1.3

ඉගෙනුම් ඵලය: 3.5.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 105
නිවැරදි පිළිතුර: **B**

1.4

ඉගෙනුම් ඵලය: 2.9.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 151
නිවැරදි පිළිතුර: **C**

1.5

ඉගෙනුම් ඵලය: 3.11.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 191
නිවැරදි පිළිතුර: **D**

1.6

ඉගෙනුම් ඵලය: 3.12.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 245
නිවැරදි පිළිතුර: **A**

1.7

ඉගෙනුම් ඵලය: 4.7.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **349**
නිවැරදි පිළිතුර: **B**

NOT FOR SALE

1.8

ඉගෙනුම් ඵලය: 4.9.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **288**
නිවැරදි පිළිතුර: **A**

1.9

ඉගෙනුම් ඵලය: 6.11.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **519**
නිවැරදි පිළිතුර: **: C**

1.10

ඉගෙනුම් ඵලය: 6.16.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: **639**
නිවැරදි පිළිතුර: **D**

(2 x 10 = මුළු ලකුණු 20)

NOT FOR SALE

පිළිතුරු අංක 02

2.1

ඉගෙනුම් ඵලය: 1.2.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 15
• ස්පෘෂ්‍ය ලක්ෂණ: සුලභතාවය හා බෙදාහැරීම, ක්‍රියාකාරීත්වය, මිල, මෝස්තරය, ඇසුරුම්ගතකරණය, භාණ්ඩ වර්ගයක් සමඟ එන අනුපූරක භාණ්ඩ පෙළ, උපාංග වල බහුලතාවය හා භාණ්ඩ භාවිතය හෝ නඩත්තු සඳහා සැපයුම්කරුවන්ගේ බහුලතාවය. • අස්පෘෂ්‍ය ලක්ෂණ: ප්‍රතිරූපය, හැඟෙන වටිනාකම, භාවිතයේ පහසුව, පහසුවෙන් ගබඩාකළ හැකි බව, භාණ්ඩ වල සෞන්දර්යාත්මක ගුණාත්මයන්, භාවාත්මක වටිනාකම, ජේත්තුකාර, අන්අයට සිත් ගන්නා සුළු, නවීන විලාසිතාව

2.2

ඉගෙනුම් ඵලය: 2.1.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 83
කාර්යක්ෂමතාවය යනුවෙන් හඳුන්වන්නේ අවම යෙදවුම් හෝ සම්පත් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීමයි. අරමුණු ළඟාකරගැනීමට හේතු වන ක්‍රියාපටිපාටීන් සිදුකිරීම, සඵලදායීතාවය ලෙස විස්තර කරයි. කාර්යක්ෂමතාවය,සම්පත් භාවිතය සමඟ සම්බන්ධ අතර සඵලදායීතාවය සම්බන්ධව පවතින්නේ ඉහළ මට්ටමේ අරමුණු ළඟාකර ගැනීම හා සම්බන්ධවයි. කළමනාකරණ ක්‍රියාවලිය තුළ උත්සාහවත් වන්නේ සම්පත් නාස්තිය අවම කිරීම සඳහා (ඉහළ කාර්යක්ෂමතාවය) සහ ඉහළ මට්ටමේ අරමුණු ළඟාකර ගැනීමක් (ඉහළ සඵලදායීත්වය) සඳහාය.

2.3

ඉගෙනුම් ඵලය: 2.6.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 95
• මධ්‍යගත සැළසුම් ආර්ථිකය - සම්පත් වෙන් කිරීම පිළිබඳව සහ තෝරාගැනීම් පිළිබඳව තීරණ ගනු ලබන්නේ රජය විසිනි. • නිදහස් වෙළඳ ආර්ථිකය –ඉල්ලුම සහ සැපයුම යන වෙළඳපොළ බලවේග මඟින් සහ මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම මඟින් සම්පත් වෙන් කිරීම සහ තෝරා ගැනීම් තීරණය වේ. • මිශ්‍ර ආර්ථිකය – සම්පත් වෙන් කිරීම පිළිබඳව ගනු ලබන තීරණ සහ තෝරා ගැනීම්, රජය (රාජ්‍ය අංශය) සහ වෙළඳපොළ බලවේග (පුද්ගලික අංශය) යන දෙකම විසින් සිදුකරයි.

NOT FOR SALE

2.4

ඉගෙනුම් ඵලය: 3.3.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 211

(i) තීරණාත්මක සාර්ථකත්ව සාධක

- ආහාර වල ගුණත්වය
- පාරිභෝගික සේවාවේ උසස් මට්ටම

(ii) යෝග්‍ය මූලික කාර්යසාධන මිනුම් දඬු:

- බෙදාහැරීමේ කාලයේ වේගවත් බව (එක් අවන්හල් සේවකයෙකු විසින් එක් අමුත්තෙකුට සේවා සැපයීම සඳහා ගන්නා සාමාන්‍ය කාලය)
- පාරිභෝගිකයන් නැවත නැවත පැමිණීම් ගණණ ප්‍රවර්ථන ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන ඇණවුම් ගණණ.
- පාරිභෝගික තෘප්තිය පිළිබඳව වන සමීක්ෂණ වලින් ලබාගත් අගයන්.
- පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව.
- සමාජ මාධ්‍ය තුළ පාරිභෝගිකයන් යොමුකිරීම් සංඛ්‍යාව.
- ආගන්තුක සත්කාර (hospitality) කළමනාකරණය සම්බන්ධයෙන් දිනා ඇති ත්‍යාග සංඛ්‍යාව.

2.5

ඉගෙනුම් ඵලය: 3.4.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 125

(a) මූල සංඛ්‍යා උපයෝගිතා න්‍යායට අනුව, යම් දෙනලද භාණ්ඩ ප්‍රමාණයක් පරිභරණය කිරීම තුළින් ලබාගන්නා තෘප්තිය නිසැකවම මැනිය හැකි බව අදහස් කෙරේ. ක්‍රමසූචක උපයෝගිතා ප්‍රවේශයට අනුව, පාරිභෝගිකයන්ගේ උපයෝගීතාවය නිසැකවම මැන බැලිය නොහැක. ඒ වෙනුවට විවිධ පාරිභෝගික භාණ්ඩ හෝ භාණ්ඩ ගොන්නක් පෙළට තැබීමෙන් ඉන් වඩාත් හොඳ භාණ්ඩය තෝරා ගනී.

(b) ක්‍රමසූචක ප්‍රවේශය යටතේ පාරිභෝගික හැසිරීම විස්තර කිරීමේදී වඩාත් කැමැත්තක් දක්වන්නේ, එමගින් තෘප්තිය සඳහා සංඛ්‍යානමය වටිනාකමක් පවරනවාට වඩා එමගින් තෘප්තිය ශ්‍රේණිගත කිරීමක් සිදුකරන ආකාරයෙනි.

NOT FOR SALE

2.6

ඉගෙනුම් ඵලය: 4.1.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 265

- ව්‍යාපාර සැලසුම්කරණයේදී නම්‍යශීලීභාවයක් ඇතිකර ගැනීම සඳහා වෙනස්වීම සඳහා ක්ෂණික සන්නිවේදනයක් ඇති කරන සරල කළමනාකරණ ව්‍යුහයක් තිබීම අවශ්‍ය වේ.
- ගතික ආර්ථික තත්ත්වයන්ට ආවේණිකව පවතින අවධානම් පිළිබඳව සෝදිසියෙන් සිටින්නෙකු වීම : යෝග්‍ය අවදානම් විශ්ලේෂණයක් පැවතීමේ වැදගත්කම, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම්කරණයක් (BCP) තිබීම සහ අනාගත ව්‍යාපාරික උපාය මාර්ග සඳහා අවිනිශ්චිතතා කළමනාකරණය ස්ථාපිත කිරීම.

2.7

ඉගෙනුම් ඵලය: 4.5.3
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 342

වියදම් මාරු කිරීමේ ප්‍රතිපත්ති:

- දේශීය මුදල ක්ෂයවීම / දේශීය මුදල අවප්‍රමාණය වීම.
- ආනයන සීමා කරන තීරුබදු හෝ ආනයන සලාක පැනවීම හෝ විනිමය පාලන රෙගුලාසි දැඩි කිරීම වැනි සෘජු ක්‍රමවේද.

වියදම් අඩුකිරීමේ ප්‍රතිපත්ති :

- දේශීය ආර්ථිකයෙහි සමාහාර ඉල්ලුම අඩු කිරීම සඳහා ගෘහස්ථ අවධමනය - රජයේ වියදම් අඩ කිරීම, රාජ්‍ය ආයෝජන කපා හැරීම ආදිය.

2.8

ඉගෙනුම් ඵලය: **4.6.2**
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 334

- රජයේ වියදම් පිළිබඳ තීරණයන් රජයට සැපයුම් කරන්නන් හට බලපායි. (උදා: යන්ත්‍රෝපකරණ සැපයුම්කරුවන්,)
- බදු ප්‍රතිපත්තිය මගින් විකුණුම් ආදායම කෙරෙහි බලපාන අතර පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව තීරණය කරයි. සමාගම් ලාභය මත බදු සහ බදු ප්‍රතිපාදන, බදු පසු ආයෝජන මත ප්‍රතිලාභ කෙරෙහි බලා පායි.
- රජය සිය වියදම් එකම මට්ටමක තබාගෙන බදු මට්ටම පහළ දැමුවේ නම්, එය ආර්ථිකයෙහි ඉල්ලුම උත්තේජනය කරනු ඇති අතර, පරිභෝජනය හෝ ඉතිරිකිරීම/ ආයෝජනය සඳහා ආයතන සහ කුටුම්භයන් සතුව බදු පසු මුදල් වැඩියෙන් පවතී.

NOT FOR SALE

2.9

ඉගෙනුම් ඵලය: 5.1.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 364

- අනාගතය නොදන්නා අතර බලාපොරොත්තු නොව සිද්ධි බොහෝවිට ඇතිවිය හැකි මෙන්ම සැලසුම් බොහෝ විස්තරාත්මක වේ නම් ඒවාට අනුව කටයුතු කිරීමට නොහැකි වනු ඇත.
- නිර්මාණශීලිත්වය අඩුවීම මගින් නව අවස්ථා හඳුනාගැනීම වළක්වනු ලැබේ.
- තීරණ ගැනීමේදී ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල පිළිබඳව පවත්නා බිය, කළමනාකරුවන්, සැලසුම්කරණය සඳහා යොමුවීම වැළැක්වීමට හේතු වේ.
- නිලධාරීවාදී සම්බාධක තුළින් කළ යුතු වෙනස කිරීම් (change) වලට බාධා ඇති වේ.
- වර්තමාන සංවර්ධනයන් සඳහා යොමුවීම.
- ඍණාත්මක වීම.
- සම්පත් ප්‍රමාණාත්මක නොවීම.
- දුර්වල සන්නිවේදනය.
- විරෝධය.

2.10

ඉගෙනුම් ඵලය: 6.4.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 464

ධාරිතා සැලසුම්කරණය සඳහා විවිධ ක්‍රම පවතී.

- ධාරිතා මට්ටම් සැලසුම – සැලසුම්කරන කාලපරිච්ඡේදයේදී ක්‍රියාකාරකම් ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම සඳහා හා ඉල්ලුම් පුරෝකථනයේ උච්චාවචනයන් නොතකා හැරීමට භාවිතා කරනු ලබන සැලසුම් ධාරිතා මට්ටම් සැලසුම් නම් වේ. මේ සඳහා කාර්ය මණ්ඩල සහ අනෙකුත් නිෂ්පාදන සම්පත් ස්ථාවරව තබාගනී.
- ධාරිතාවය හඹායාමේ සැලසුම - මෙය ධාරිතා මට්ටම් සැලසුමෙහි ප්‍රතිවිරුද්ධ සැලසුමයි. මෙමගින් ඉලක්ක කරන්නේ ධාරිතාවය ඉල්ලුමේ උච්චාවචනයන්ට අනුව තුලිත කිරීමයි.
- ඉල්ලුම් කළමනාකරණ සැලසුම–උපරිම ඉල්ලුම් කාලපරිච්ඡේදයන්හිදී ඉල්ලුම අවම ඉල්ලුම් කාලපරිච්ඡේදයන් වෙත මාරු කිරීමෙන් උපරිම ඉල්ලුම් කාලපරිච්ඡේදයන්හි ඉල්ලුම අඩුකිරීම අරමුණයි.
- ඉහත වර්ග තුනෙහිම සැලසුම්වල මිශ්‍රණයක් (මිශ්‍ර සැලසුම්)- සැලසුම්කරණය බොහෝ විට ධාරිතා මට්ටම් සැලසුම්කරණය, ඉල්ලුම හඹායාමේ සැලසුම්කරණය සහ ඉල්ලුම් කළමනාකරණ සැලසුම්කරණය යන ඒවායේ මිශ්‍රණයකි.

2 වන කොටස

පිළිතුරු අංක 03

ඉගෙනුම් ඵලය: 4.4
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 322/329/324

(a) පහත සඳහන් සාර්ව ආර්ථික විචල්‍යයන් සම්බන්ධයෙන්, ඉහළ මිල උද්ධමන අනුපාතයක්, හානිකර සහ අවාසිදායක ලෙස බලපාන බව සලකනු ලැබේ.

(i) **ගෙවුම් ශේෂය:**

- දේශීය වෙළඳපොළ තුළ පවතින ඉහළ උද්ධමන අනුපාතය, විදේශීය ගැනුම්කරුවන්ට දේශීය භාණ්ඩ සඳහා ඇති ආකර්ෂණය අඩුකරන අතර එම නිසා අපනයන සඳහා ඉල්ලුම පහළ යයි.
- ඉහළ දේශීය මිල ගණන් නිසාවෙන්, ආනයන ඉහළ දැමීමට හේතුකාරක වන, විදේශීය භාණ්ඩ මිලදී ගැනීමට ස්වදේශිකයන් වඩා රුචිකත්වයක් දක්වයි.
- දේශිය මිල ඉහල බැවින් දේශිය පාරිභෝගිකයන් විදේශිය භාණ්ඩ මිලට ගැනීමට කැමැත්තක් දක්වන අතර එමගින් ආනයන ඉහළ යයි.
- පහළ යන අපනයන වල සහ ඉහළ යන ආනයන වල ප්‍රතිඵල, ගෙවුම් ශේෂයේ අහිතකර අසමතුලිතාවයක් ඇතිවීමට හේතු වේ.
- මෙම අහිතකර තත්වය, විදේශ විනිමය සංචිතවල වේගවත් පහළයාමකට මෙන්ම බාහිර ගෙවීම් පැහැර හැරීමකට හේතුවනු ඇත.

(ii) **ආර්ථික වර්ධනය**

- ඉහළ උද්ධමනය යනු අවම පරිභෝජනයයි. භාණ්ඩ හා සේවා සඳහා අඩු ඉල්ලුමක් පවතී. මෙය නිෂ්පාදනය කෙරෙහි සෘණාත්මකව බලපාන අතර ආර්ථිකයෙහි වර්ධන වේගය අඩුකරයි.
- ඉහළ උද්ධමන තත්වයකදී නිෂ්පාදන සාධක වල මිල ඉහළ ගොස් නෂ්පාදනයන අධෛර්‍යයමත් කරයි. එම නිසා ආර්ථික වර්ධනය අධෛර්‍යයමත් වේ.
- ඉහළ උද්ධමනයක දී, පොලී අනුපාතිකයන් ඉහළ යාමෙන් ඉතුරුම් ධෛර්‍යයමත වේ. එම නිසා ආයෝජනයන් අධෛර්‍යමත් වී ආර්ථික වර්ධනය අඩු වේ.

(b) සේවා වියුක්තියෙහි සෘණාත්මක ප්‍රතිඵලයන් වන්නේ,

- නිමැවුම අඩු වීම - ශ්‍රම සේවා වියුක්තියක් ඇත්නම්, ආර්ථිකය තුළින් උපරිම නිමැවුමක් ජනිත නොවේ. එවිට, මුළු ජාතික නිෂ්පාදිතය තිබිය යුතු අගයට වඩා පහළ අගයක් ගනී.
- මානව ප්‍රාග්ධනය අඩු වීම - සේවා වියක්ත ශ්‍රමිකයන්ගේ කුසලතාවයන් හීනවේ. හැකියාවන් පවත්වාගත හැකි වන්නේ වැඩකරන අතරතුර වීම එයට හේතුවයි.
- ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය වැඩිවීම – දුගී බව ඉහළයයි, දේශපාලන අස්ථාවරත්වය
- සමාජ පිරිවැයන් – සේවා වියුක්තිය නිසා පෞද්ගලික පීඩාවන්, මානසික ආතතිය වැනි සමාජමය ගැටළු ඇතිවේ.
- සහසාධන ගෙවීම්වල ඉහළ යන පිරිවැය භාර

(c) එම ප්‍රතිපත්ති වලින් සමහරක්, ශ්‍රම ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රම බලකාය පුහුණු කරයි. සිය ශ්‍රම බලකායේ කුසලතාවයන් සහ නිපුණතාවයන් ඉහළ නැංවීම සඳහා පුහුණුව සැපයීමට, විවිධ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට රජයට හැකියාව ඇත. එම නසා විවිධ අංශයන්හි නිෂ්පාදනය වැඩිකිරීමට ඔවුන්ට දායකවිය හැකි අතර, අනිත් අතට එය, වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් නිර්මාණය කිරීමට උපකාර වේ.

- නව තාක්ෂණය හඳුන්වාදීම.
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිමත් කිරීම.
- නවෝත්පාදන සඳහා දිරිදීමනා ලබාදීම.
- මූලික /ප්‍රධාන ග්‍රාමීය ප්‍රදේශවල ශ්‍රමිකයන්ට සහනාධාර ප්‍රදානය.
- ශ්‍රම සංචලතාවය දිරිමත් කිරීම - නැවත පිහිටුවීමේ වියදම් ප්‍රතිපූර්ණය, ඇබෑර්තු පිළිබඳ තොරතුරු ප්‍රවාහය වැඩිදියුණු කිරීම.
- අවම වේතන පිළිබඳ රෙගුලාසි පවතින විට ඒවා අවලංගු කිරීම/අහෝසි කිරීම.
- ආවෘත සාප්පු ගිවිසුම් (closed shop agreements) අහෝසි කිරීම.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

<u>පිළිතුරු අංක 04</u>

ඉගෙනුම් ඵලය: **5.4/5.5**
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක:

(a) හර්ස්බර්ග් ගේ ද්වි සාධක න්‍යායට අනුව, ඕනෑම ව්‍යාපාර සංවිධානයක සේවකයන් අභිප්‍රේරණය කරන සාධක වන්නේ,

- ස්වාස්ථ සාධක - ආයතනික ප්‍රතිපත්තීන් හා කළමනාකරණය, වැටුප්, අධීක්ෂණයේ ගුණාත්මකභාවය, අන්තර්පුද්ගල සබඳතා, වැඩ තත්ත්වයන්/කොන්දේසි, රැකියා සුරක්ෂිතතාවය ආදිය.

- අභිප්‍රේරක සාධක - තත්ත්වය, අභිවර්ධනය, පිළිගැනීම, වගකීම, අභියෝගාත්මක කාර්යයන්, කාර්ය සාධක ආස්වාදය, රැකියාවේ වර්ධනය.

(b) සංවිධානයක සඵලදායී සන්නිවේදන පද්ධතියක් පැවතීමේ (වැදගත්කම) වාසි:

- ඕනෑම ව්‍යාපාර සංවිධානයක සැලසුම්කරණය, සමායෝජනය සහ පාලනය සඳහා සන්නිවේදනය අවශ්‍ය වේ.
- සන්නිවේදනය මූලික වශයෙන්ම කළමනාකරණ කාර්යසාධනය හා සම්බන්ධ වේ.
- කළමනාකරණයේ තීරණ ගැනීම සඳහා දත්ත/තොරතුරු අවශ්‍ය වේ. එම තොරතුරු සන්නිවේදනය කළ යුතු වේ. කළමනාකරුවන් සන්නිවේදන පද්ධතියක කේන්ද්‍රයේ සිටිති.
- අන්තර්දෙපාර්තමේන්තු සමායෝජනය තොරතුරු ප්‍රවාහයන් මත රඳා පවතී.
- පුද්ගල අභිප්‍රේරණය සහ ඵලදායීතාවය, සන්නිවේදනය මත රඳා පවතී.
- සන්නිවේදනයෙන් තොරව, වඩාත් හොඳ අදහස්වලට/නිර්මාණශීලී යෝජනාවලට හෝ වඩාත් හොඳ සැලසුම්වලට කිසිදු වටිනාකමක් නොමැත.

(c) වැරදි අවබෝධයන් නැති කිරීම සඳහා ආයතනයකට ගතහැකි පියවර වන්නේ,

- ප්‍රතිචාරය/(තහවුරුව)සහතිකවීම භාවිතා කිරීම - කළමනාකරුවන් විසින් වාචික සහ වාචික නොවන යන දෙයාකාරයේම ප්‍රතිචාරය/සහතිකවීම(තහවුරුව) ලබාගත යුතුය.
- පණිවිඩයක් එක් ආකාරයකට වඩා වැඩි ආකාරයන් භාවිතයෙන් නිකුත් කිරීම.
- කළමනාකරුවන් මත අනවශ්‍ය ලෙස තොරතුරු පැටවීම වැළැක්වෙන පරිදි ව්‍යාතිරේකීය වාර්තාකරණය සිදුවිය යුතුය.
- තම කටයුතු පැහැදිලිව හා නිරවුල්ව සිදුකිරීම සඳහා කළමනාකරුවන් පුහුණු කිරීම.
- කළමනාකරුවන් සහ සෘජු යටත් නිලධාරීන් අතර අන්තර්පුද්ගල විශ්වාසනීයත්වය ගොඩනැගීම.
- හැකි සෑම විටම සරල භාෂාවක් භාවිතා කිරීම.
- ක්‍රියාකාරී සවන්දීමේ සංස්කෘතියක්/වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුරු අංක 05

ඉගෙනුම් ඵලය : 6.7.1/6.7.2/3.12.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 485/238

(a)

සේවකයන්	සාමාන්‍ය නිෂ්පාදිතය	මුළු නිෂ්පාදිතය	ආන්තික නිෂ්පාදිතය
1	9	9	-
2	10.5	21	12
3	10.67	32	11
4	10.5	42	10
5	10.2	51	9

(b)





NOT FOR SALE

- ඉහළ යන නිෂ්පාදන කාර්යක්ෂමතාවය, ඒකක පිරිවැය පහළයාමට හේතු වේ.
- අනෙක් අතට, හීනවන නිෂ්පාදන කාර්යක්ෂමතාවය, ඒකක පිරිවැය ඉහළ යාමට හේතුවේ.
- හීනවන ආන්තික ඵලදා න්‍යාය මගින් ගෙනහැර දක්වන්නේ කෙටිකාලයේදී මුල් අවස්ථාවේදී නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩිවන අතර ඉන්පසු පහළ යන බවයි.

(c) ලාභ උපරමකරන නිමැවුම් මට්ටම තීරණය කිරීමේදී ප්‍රවේශයන් දෙකක් ඇත. එනම්;

1. සමස්ථ ප්‍රවේශය
2. ආන්තික ප්‍රවේශය

රූප සටහනේ පෙන්නුම් කරන පරිදි, ලාභ උපරම කරන නිමැවුම් මට්ටම හටගෙන ඇත්තේ, මුළු ආදායම (TR) සහ මුළු පිරිවැය (TC) අතර වෙනස වඩාත් විශාල වන Q* හිදීය.

ආන්තික ප්‍රවේශය යටතේ,ලාභ උපරම කරන තත්වය වන්නේ ;
MR= MC (ආන්තික ආදායම ආන්තික පිරිවැයට සමාන වන අවස්ථාවයි

TR (මුළු ආදායම) හි පළමුවන ව්‍යුත්පන්නය MR (ආන්තික ආදායම) වන අතර, TC (මුළු පිරිවැය) හි පළමුවන ව්‍යුත්පන්නය MC (ආන්තික පිරිවැය) වේ.

රූප සටහන ;



(මුළු ලකුණු **10**)

NOT FOR SALE

පිළිතුරු අංක 06

ඉගෙනුම් ඵලය: 6.12
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 585/587/595

(a) කාර්යසාධනය පදනම් කරගත් දිරිදීමනා වැඩසටහන් පැවතීමේ වාසි:

- සේවකයන්ගේ උත්සාහයන් සහ අවධානය වඩාත් අවශ්‍ය කරන ස්ථානය වෙත යොමුවීම සිදුවේ.
- කැපවීම සහ අභිප්‍රේරණය වැඩිවීම සිදුවේ. මෙය වඩාත් වැදගත් වනුයේ, වැඩිදියුණු වීම සඳහා සංස්කෘතික බාධාවන් පවතින විටදීය.
- සාක්ෂාත් කරගැනීම (ඉලක්ක ඉටු කරගැනීම) සඳහා ප්‍රයත්නයන්ගෙන් වෙන්වූ ප්‍රතිලාභ ලබාදිය හැකිවේ. මේ තුළින් ඉහළ ගුණාත්මයෙන් යුතු සේවකයන් බඳවාගැනීම සහ රඳවාගැනීමේ වාසියද අත්වේ.
- ශ්‍රම පිරිවැය, සංවිධානමය කාර්යසාධනය හා සම්බන්ධ වේ.

(b)

- නම්‍යශීලී සේවා පැය.
- පුහුණුකිරීම්.
- නිවසේ සිට වැඩ කිරීම/අතථ්‍ය (virtual) කාර්යාල පහසුකම්.
- වෘත්තීය පිළිබඳ ක්‍රමයෙන් වැඩෙන ප්‍රගතිය.
- ආයතනය විසින් හරිත හෝ ආචාරශීලි ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදවීම.

(c) විවේකය සඳහා ශ්‍රමිකයන්ගේ කැමැත්ත (ශ්‍රම විශ්‍රාන්ති ආකෘතිය)

- ආදේශන ප්‍රතිවිපාකය - මෙහිදී වැටුප් අනුපාතයේ වැඩිවීම, විවේකයේ ආවස්ථික පිරිවැය වැඩිකරන අතර, ඒ අනුව වැඩ නොකර සිටින පැය ගණනට, විශාල ආදායමක්ද කැපකිරීමට සිදුවේ. එසේ වන්නේ, පැයක් වැඩනොකර සිටීමෙන් ශ්‍රමිකයාට අහිමිවන මුදලද වඩා වැඩි එකක් වන හෙයිනි. ආදේශන ප්‍රතිවිපාකය මගින්, පුද්ගලයන්, විවේකය වෙනුවට, වැඩකරම, ආදේශනය කිරීම සඳහා යොමු කෙරේ.

- ආදායම් ප්‍රතිවිපාකය - ඉහළ වැටුප් අනුපාතය මගින් පුද්ගලයන්ගේ මූර්ත ආදායම වැඩිවන නිසා, ඔවුන්ගේ පාරිභෝජනයද වැඩිවේ. ආදායම වැඩිවීමක් සමග, ඉහළ ආදායම් ලබන්නන්ට අඩුවෙන් වැඩ කිරීමෙන්, විවේකය වැඩිපුර පරිභෝජනය කළ හැකිවේ. (වැඩිකාලයක් විවේකය සඳහා වෙන් කළ හැක)

(මුළු ලකුණු 10)

NOT FOR SALE

3 වන කොටස

පිළිතුරු අංක 07

ඉගෙනුම් ඵලය: 3.5/3.6/3.7/3.8
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 137/139/202/178

(a)

ඉල්ලුමට බලපෑම් කරන සාධක

- Y රටෙහි පාර්භෝගිකයන් ගේ ආදායම් මට්ටම
- සීනි වෙනුවට භාවිතා කළ හැකි ආදේශකයන් හි මිල
- ජනගහනයේ වැඩි වීම.

සැපයුමට බලපෑම් කරන සාධක

- සේවකයන්ගේ වැටුප් මට්ටම්
- අමුද්‍රව්‍ය වල මිල ගණන්
- කාලගුණික තත්වය
- තාක්ෂණයේ වෙනස්වීම්
- සීනි මිල ගණන් වල අපේක්ෂිත ඉහළ යැමක්

(b)

(i) වෙළඳපොළ සමතුලනයේදී , Qd = Qs

200-4P = -160 P +8 P

P = 30

සමතුලිත මිල Y ඩොලර් 30.00 කි.

Qd = 200 -4 P

= 200- 4(30)

= 80

සමතුලිත ප්‍රමාණය කි.ග්‍රෑම් 80 කි.

(ii)

සමතුලිත මිලෙහිදී මිල ඉල්ලුම් නම්‍යතාවය:

ඩෙල්ටා Q/ ඩෙල්ටා P * P/Q

= -16/4 * 30/80

= **- 1.5**

(c)

Y$ 25 දී ඉල්ලුම

Qd = 200-4P

Qd= 100

Y$ 25 දී සැපයුම

Qs = -160 +8 (25)

Qs = 40

ඉල්ලුම් අතිරික්තය = 100-40 = 60

ආනයන වියදම = 60*25 = Y$ 1,500

NOT FOR SALE

(d) (i)

අතිරික්ත සැපයුම = Y$ 40 දී සැපයුම - Y$ 40 දී ඉල්ලුම

Qs= - 160+ 8 (40)

Qs= කි.ග්‍රෑම් 160

Qd= 200- 4(40)

Qd= කි.ග්‍රෑම් 40

ඒ අනුව, 160- 40 = කි.ග්‍රෑම් 120

රජයේ මුළු පිරිවැය: 120 * 40 = **Y$ 4,800**

(ii)

- සහතික කළ මිල, සමතුලිත මිලට වඩා ඉහළින් පිහිටවූ විට, සැපයුම් ප්‍රමාණය, ඉල්ලුම් ප්‍රමාණය ඉක්මවා යයි.
- නිෂ්පාදන අතිරික්තය, පාරිභෝගික අතිරික්තයට වඩා ඉහළ යයි.

(e)

(i) තරඟකරුවන් විශ්ලේෂණය සිදුකිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක වන්නේ:

- තරඟකරුවන්ගේ ඉලක්ක - ආයතනය සමස්ථයක් වශයෙන් සහ ව්‍යාපාර ඒකකයක් වශයෙන්, තරඟකරුවන්ගේ සඳහන් මූල්‍ය ඉලක්කයන් මොනවාද? ඔවුන්ගේ සංවිධාන ව්‍යුහය සහ කළමනාකරණ විලාශය යනාදිය .
- කර්මාන්තය පිළිබඳව තරඟකරුවන්ගේ උපකල්පනයන් - සිය සාපේක්ෂ වෙළඳපොළ කොටස යනාදිය පිළිබඳව තරඟකරුවන්ගේ විශ්වාසය කුමක් වේද?
- තරඟකරුවන්ගේ ප්‍රවර්ථන සහ විභව තත්වය සහ පවත්නා ව්‍යාපාරික උපායමාර්ගය.

  බෙදාහැරීමේ උපාය මාර්ගය, භාණ්ඩ, අලෙවිකරණ සහ විකිණීම ආදිය.
- තරඟකරුවන්ගේ හැකියාව - මධ්‍ය නිපුණත්වය සහ ප්‍රසාරණය වීමේ හැකියාව.

(ii) උපාය මාර්ගික භාවිතයන් සඳහා අවශ්‍ය තොරතුරු, පහත මූලාශ්‍ර වලින් රැස්කරගත හැක.

- තරඟකරුවන්ගේ මූල්‍ය ප්‍රකාශන.
- පොදු පාරිභොගිකයන්ගෙන සහ සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා තොරතුරු.
- තරඟකරුවන්ගේ භාණ්ඩ පරීක්ෂාව.
- පූර්ව සේවකයන්ගේ ලබාගත් තොරතුරු.
- රැකියා පිළිබඳ දැන්වීම්.

(මුළු ලකුණු 20)

NOT FOR SALE

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය “එසේම” යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු “ආදර්ශ පිළිතුරු” ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි. සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.